# අප කරන්නේ කුමක් ද?

ක්‍රිස්තු වර්ෂයෙන් විසිවැනි සියවස බටහිර ක්‍රිස්තියානි නූතනත්වයේ කඩා වැටීම ආරම්භ වූ සියවස විය. පහළොස්වැනි සියවසේ දකුණු හා නැගෙනහිර යුරෝපයේ ඇරඹි බටහිර ක්‍රිස්තියානි නූතනත්වය සියවස් හයක් ගත වීමට පෙර බටහිරයන්ට සුපුරුදු බසින් කිව හොත් ඉතිහාසයේ වේදිකාවෙන් ඉවත් වීම ඇරඹීම බටහිරට ඔරොත්තු දෙන්නක් විය නොහැකි ය. එහෙත් බටහිර සාමාන්‍ය ජනතාවට ඒ පිළිබඳ අවබෝධයක් නැත. ඔවුන් දන්නා කඩා වැටීමක් ද නැත.

පසුගිය සැප්තැම්බර් මාසයෙහි බටහිර මූල්‍ය අර්බුදයක් විය. බටහිර රටවල රාජ්‍ය මැදිහත් වී බැංකුවලට මුදල් ලබා දීම මඟින් තත්ත්වය යම් පාලනයකට යටත් කර ඇති බව පෙනෙයි. මේ අර්බුදය තිස් ගණන්වල ඇති වූ දරුණු අවපාත තත්ත්වය සමඟ සංසන්දනය කළ හොත් නම් ආර්ථිකය තවමත් විශාල පීලි පැනීමක් කර නොමැත. එහෙත් මුළු මහත් ආර්ථිකය ම වැඩි කල් නො ගොස් විශාල පරිහානියකට පත් වනු ඇත. එයට හේතු දැකිය හැකි වනුයේ මාක්ස්වාදයෙහි හෝ ලිබරල් ධනපති ක්‍රමයෙහි නො ව සමස්ත රටාව තුළ ය.

ආර්ථික ක්‍රමය කඩා වැටී බටහිර විද්‍යාව කඩා නො වැටී තිබේ යැයි කිව හැක්කේ සමස්තයෙහි එකක් අනෙක සමඟ බැඳී නැතැයි කියන්නකුට ය. සියල්ලට ම පළමු කඩා වැටුණේ බටහිර භෞතික විද්‍යාව ය. බටහිර ගණිතය ද එයට ස්වල්ප කලකට පසු කඩා වැටුණි. අද බටහිර ගණිතයේ පදනම කඩා වැටී අවසාන ය. ඒ පදනම නැවත පිළිසකර කිරීමට උත්සාහ කිරීම ඇතැමුන් ගේ ප්‍රතිපත්තියට එකඟ ය. එහෙත් ඒ කළ නොහැක්කකි. බටහිර විද්‍යාව හා බටහිර ගණිතය පදනම් වන ප්‍රධාන කුලුනක් වන්නේ ඇරිස්ටෝටලීය න්‍යාය ය. එහෙත් ඒ ප්‍රමාණවත් නො වන බව ක්වොන්ටම් භෞතික විද්‍යාවෙන් මෙන් ම ගණිත න්‍යායෙහි කියැවෙන ගර්ඩල් (Godel) ප්‍රමේයයෙන් ද පැහැදිලි වෙයි.

බටහිර විද්‍යා හා බටහිර ගණිතය බිහි වූයේ පහළොස්වැනි සියවසේ ආරම්භ වූ චින්තන විප්ලවය හේතු කොටගෙන ය. මේ චින්තන විප්ලවය අනෙකක් නො ව බටහිර ග්‍රීක යුදෙව් ක්‍රිස්තියානි චින්තනය මඟින් එතෙක් යුරෝපයේ ආධිපත්‍යය ඉසිලූ බටහිර කතෝලික චින්තනය බැහැර කිරීම ය. චින්තනයක ඥාන විභාගයක්, න්‍යායයක් (Logic) ආකල්ප ආදිය වෙයි. කතෝලික චින්තනයෙහි න්‍යාය ත්‍රිකෝටික න්‍යාය විය. එහි තර්කනය (Reasoning) රේඛීය විය. එය සිතීමේ දී සංයුක්තයට බර විය. ඒ අතර ලෝකය සමස්තයක් ලෙස දුටුවේ ය. විශ්ලේෂණය නො ව සංශ්ලේෂණය ප්‍රධානත්වයෙන් ගත්තේ ය. එසේ ද වුවත් ලෝකය මිනිසා වෙනුවෙන් මවා ඇති බව පිළිගත්තේ ය. කතෝලික චින්තනයෙහි ලෝකය සමස්තයක් ලෙස සැලකුණු බැවින් සමාජයට පුද්ගලයාට වඩා වැදගත් තැනක් හිමි විය. එමෙන් ම පුද්ගලයන් හා භූමිය අතර ද බැඳීමක් විය. මිනිස්සු භූමිය හෙවත් ඉඩම් සමඟ බැඳී සිටිය හ.

පහළොස්වැනි සියවසෙහි දී මේ සියල්ල ම මෙන් ම කණපිට හරවනු ලැබිණි. එහි දී වෙනස් නො වූයේ රේඛීය තර්කනය හා ලෝකය මිනිසා වෙනුවෙන් මවා ඇතැයි යන ආකල්පය ය. න්‍යාය ත්‍රිකෝටිකයෙන් නැවතත් ඇරිස්ටෝටලීය ද්විකෝටිකය වෙත ආපසු ගියේ ය. විශ්ලේෂණය වැදගත් තැනක් අත්පත් කරගත්තේ ය. ලෝකය සමස්තයක් ලෙස නො ව කොටස්වල එකතුවක් ලෙස ගැනිණි. සමාජය වෙනුවට පුද්ගලයා ඉදිරියට පැමිණියේ ය. පුද්ගලයා අනෙක් පුද්ගලයන් ගෙන් ද භූමියෙන් ද වෙන් කරනු ලැබිණි. වෙන් කිරීම හා කොටස්වලට කැඩීම නව චින්තනයෙහි ප්‍රධාන ලකෂණයක් විය. පුද්ගලයන් ගේ ඉන්ද්‍රිය පිනවීම ප්‍රධාන කටයුත්තක් බවට පත් විණි. සංයුක්තව සිතීම වෙනුවට වියුක්තව සිතීම ඉදිරියට ගනු ලැබිණි.

මේ නව චින්තනයෙහි ග්‍රීක චින්තනයෙහි ද යුදෙව් චින්තනයෙහි ද කොටස් අඩංගු විණි. කතෝලික ආගමට ප්‍රතිපකෂව ක්‍රිස්තියානි ආගම උපත ලැබුයේ මේ චින්තනයෙහි ය. මේ නව චින්තනය ග්‍රීක යුදෙව් ක්‍රිස්තියානි චින්තනය ලෙස හැඳින්වෙන්නේ එබැවිනි. ලියානාදො දාවින්චි, මිචලාංජිලෝ ආදීහු මේ චින්තනයෙහි පුරෝගාමීහු වූවෝ. ය. කොපර්නිකස්, ගැලිලීයෝ ගැලිලි ආදීහු වියුක්ත ව සිතීමෙන් බටහිර විද්‍යාව බිහි කිරීමෙහි ලා පුරෝගාමී කටයුත්තක් ඉටු කළ හ. බටහිර ක්‍රිස්තියානි නූතනත්වය දකුණු යුරෝපයෙහි එසේ ඇරඹුණි. භූමියෙන් හා එකිනෙකා ගෙන් වෙන් කරනු ලැබූ පුද්ගලයන්ට අවසානයේ දී හිමි වූයේ තම ශ්‍රමය පමණකි. ශ්‍රමය විකුණා ජීවත් වීම හැරෙන්නට ඔවුන් අති විශාල බහුතරයකට කළ හැකි අන් කිසිවක් නො වී ය. ධනපති ක්‍රමය ද බටහිර ක්‍රිස්තියානි නූතනත්වයෙන් ම බිහි වූයේ

එවැනි පසුබිමක ය. බටහිර විද්‍යාව ධනපති ක්‍රමය විසින් බිහි කෙරුණක් නො ව ඒ දෙක ම සහ තවත් දේ බටහිර ක්‍රිස්තියානි නූතනත්වය විසින් බිහි කෙරිණි. නව ග්‍රීක යුදෙව් ක්‍රිස්තියානි චින්තනය විසින් ඒ සියල්ල පෝෂණය කෙරිණි. බටහිර විද්‍යාව බිහි වීමේ දී භාරතයෙන්, චීනයෙන්, ලංකාවෙන් සහ වෙනත් රටවලින් බටහිරට ගලා ගිය දැනුම ග්‍රීක යුදෙව් ක්‍රිස්තියානි චින්තනය තුළ සකස් කෙරී වෙනත් දැනුමක් බිහි විය. භාරතයේ සංයුක්ත දැනුමක් ව තිබි පොළොව සූර්යයා වටා ගමන් කිරීම බටහිර විද්‍යාවෙහි දී වියුක්ත දැනුමක් බවට පත් විය.

ආරම්භයේ දී බටහිර විද්‍යාව බිහි වුයේ භාරතයේ හා වෙනත් රටවල දැනුම් බටහිර නව චින්තනය වූ ග්‍රීක යුදෙව් ක්‍රිස්තියානි චින්තනයට හා යුදෙව් ක්‍රිස්තියානි සංස්කෘතියට අවශෝෂණය කිරීමෙනි. එහෙත් කල් යත් ම බටහිර විද්‍යාව බටහිර ම නිර්මාණය විණි. බටහිර විද්‍යාව පමණක් නො ව මුළු මහත් බටහිර දැනුම ම ග්‍රීක යුදෙව් ක්‍රිස්තියානි චින්තනයෙහි පදනම විය. නිව්ටෝනීය යාන්ත්‍රිකය බොහෝ කරුණු අතින් බටහිර විද්‍යාවේ හා බටහිර දැනුමේ පරමාදර්ශ විය. සමස්තය කොටස්වලට කැඩීමේ සිට වියුක්ත ව සිතීම දක්වා බොහෝ දෑ නිව්ටෝනීය යාන්ත්‍රිකයෙහි අඩංගු විය.

බටහිර ක්‍රිස්තියානි නූතනත්වය දිගින් දිගට ම යුරෝපයෙහි වර්ධනය විය. දහ හත්වැනි සියවස අගභාගය වන විට විශ්වාසය වෙනුවට තර්කනය ඉදිරියට පැමිණියේ යැයි කියැවෙයි. ගුඪත්වය පිටුදැකීම බටහිර දැනුමේ ප්‍රධාන අරමුණක් ලෙස ප්‍රකාශ කෙරිණි. ආලෝකනනය (Enlightment) දහ අටවැනි සියවසේ දී හඳුන්වා දෙනු ලැබිණි. එහෙත් මේ සෑම තැනක දී ම සිදු වුයේ ප්‍රධාන උපකල්පන සඟවා තැබීම පමණකි. එමෙන් ම දැනුමෙහි පදනම ගැන ද කිසිවක් නො කියැවිණි.

තර්කනය පදනම් වුයේ ඇරිස්ටෝටලීය න්‍යාය මත ය. ඒ තර්කනයෙහි මූල හේතුවක් විය. ඒ එකරේඛීය විය. එක් තැනකින්, එක් ප්‍රස්තුතයකින්, පටන්ගෙන අගයන් දෙකක් පමණක් සහිත ඇරිස්ටෝටලීය ද්විකෝටික න්‍යාය මත පදනම් ව තර්කනයෙන් යම් නිගමනවලට පැමිණීම බටහිර දැනුමේ ප්‍රධාන ලකෂණයක් විය. එහෙත් කිසි විටෙකත් මූල හේතුව හෙවත් මූල ප්‍රස්තුතය ප්‍රශ්න නො කෙරිණි. එය සැම දා මත් උපකල්පනයක මට්ටමේ ම විය. එහෙත් බොහෝ දෙනා මේ ක්‍රමයෙන් වශී වූහ.

බටහිර විද්‍යාව අනෙක් දැනුම්වලින් වෙනස් යැයි හඳුන්වා දෙනු ලැබිණි. එහි විද්‍යාත්මක විධික්‍රමයක් ඇතැයි කියා දෙනු ලැබිණි. විද්‍යාව සත්‍යය යැයි හෝ සත්‍යයයට ක්‍රඹයෙන් ආසන්න වේ යැයි ප්‍රකාශ විණි. විද්‍යාත්මක නො වන දැනුම මිථ්‍යාව වේ යන මතය ක්‍රමයෙන් ප්‍රචාරය කෙරිණි. එමෙන් ම බටහිර විද්‍යාව හා ඒ මත පදනම් වූ බටහිර අනෙක් දැනුම් වාස්තවික බවත් ඒ නිරපේකෂ බවත් කියැවිණි. බටහිර දැනුම මුළු ලෝකයට ම පොදු වූ ගෝලීය දැනුමක් ලෙස ප්‍රචාරය කෙරිණි. බටහිර දැනුම අනෙක් දැනුම් පද්ධතීන්ට වඩා උසස් ය යන හැඟීම ද ලබා දිනි. බටහිර දැනුම වාස්තවික නිරපේකෂ හා ගෝලීය වන විට අනෙක් දැනුම් පද්ධතීන් හුදු දේශීය, සාපේකෂ, එක් කාලයකට පමණක් වලංගු දැනුම් බවට මතයක් ඇති කෙරිණි.

බටහිර ක්‍රිස්තියානි නූතනත්වය සියවස් පහක හයක පමණ කාලයක එසේ වර්ධනය විය. බටහිර ක්‍රිස්තියානි නූතනත්වයේ ම අංගයක් වූ ධනපති ක්‍රඹය ද වර්ධනය විය. ස්වාභාවික සම්පත් මිනිසුන් විසින් ඉවක් බවක් නැති ව සූරා කනු ලැබුයේ ඒ සියල්ල මිනිසා වෙනුවෙන් මවා ඇත යන ආකල්පය පෙරදැරි කරගනිමින් ය. එපමණක් නො ව මිනිස් ශ්‍රමය ද සූරා කෑමට ලක් විය. මිනිසුන් උනන්දු කරනු ලැබුයේ තමන් ගේ ඉන්ද්‍රිය පිනවීමට මිස ආශාවන් පාලනය කිරීමට නො වේ. සමාජයට (සමස්තයට) වඩා පෞද්ගලිකත්වය ඉහළින් සැලකූ සමාජයක පුද්ගලයාට වැඩි නිදහසක් හිමි විය. පෞද්ගලික නිදහසේ සීමාව වුයේ අන් පුද්ගලයන් ගේ පෞද්ගලික නිදහස ය. අන් අයකු ගේ පෞද්ගලික නිදහසට බාධා නො වන තාක් පුද්ගලයකුට තමන්ට අවශ්‍ය දෙයක් කිරීමේ නිදහස විය.

ඊනියා සංවර්ධනය ලෙස හඳුන්වනු ලැබුයේ ඉන්ද්‍රිය පිනවීම හා මිනිස් කායික ශ්‍රමය අඩුවෙන් වැය කිරීම මූල් කරගත් භාණ්ඩ නිෂ්පාදනයක් හා අදාළ පරිභෝජන රටාවකි. ඒ සඳහා ස්වාභාවික සම්පත් සූරා කනු ලැබුවා පමණක් නො ව මතු පරම්පරාවලට යොදවා ගැනීමට තිබූ සම්පත් ප්‍රයෝජනයට ගැනිණි. සම්පත් යනු අවුරුදු කෝටි ගණනක් මුළුල්ලේ ස්වභාවධර්මය විසින් නිෂ්පාදනය කරනු ලැබූ දෑ ය. සම්පත් මවා ඇත්තේ මිනිසා වෙනුවෙන් ය යන ආකල්පය මූල්

කරගෙන සම්පත් ප්‍රයෝජනයට ගැනීමේ ප්‍රතිඵලය අද කිහිප අතකින් ම පෙනෙන්නට ඇත. කවර දා හෝ බටහිර විද්‍යාව විසින් සම්පත් ප්‍රශ්නයට විසඳුමක් දෙනු ඇතැයි යන සිහිනය පමණක් පෙරදැරි කරගෙන කරන සම්පත් විනාශය එක් පැත්තකින් පරිසර දූෂණයට ද බලපායි. එහෙත් බොහෝ දෙනා තේරුම් නො ගත්ත ද උද්ධමනය ද සම්පත් විනාශ කිරීමේ ප්‍රතිඵලයකි. මුළු ලෝකය ම අද ක්‍රියාත්මක වන්නේ ණය හා ව්‍යාජ මුදල් මත ය. පුද්ගලයෝ අනෙක් පුද්ගලයන් ගෙන් හා බැංකු ආදී ආයතනවලින් ණය ලබාගනිති. පුද්ගලයනට තම ආදායමට වඩා වියදම් කිරිමට ණයපත් (Credit Card) ලබා දී ඇත. බැංකුවලට තම වත්කම් ප්‍රමාණයට වඩා ණය දීමට ඉඩ දී ඇත. අද බැංකු අර්බුදයට ගොස් ඇත්තේ ද මූලිකව ම මේ කරුණ නිසා ය. බැංකුවලින් ණය ගන්නා ආයෝජකයන්ට පොළිය ද ගෙවා ලාභ ලැබීමට භාණ්ඩ අධික මිලට විකිණීමට සිදු වෙයි. එහෙත් ජනතාවට එවැනි මුදලක් ගෙවා භාණ්ඩ මිල දී ගත නොහැකිය. දැන් ආයෝජකයනට බැංකු ණය ආපසු ගෙවීම ප්‍රශ්නයක් වෙයි. බැංකු වැඩියෙන් ණය දී ඇති බැවින් ඒ බංකොළොත් වෙයි. ඒ අතර මුදල් නෝට්ටු මුද්‍රණය ඔස්සේ ද අර්බුද පැන නැගී ඇත. තම වත්කමට වඩා මුදල් නෝට්ටු මුද්‍රණය කිරීමෙන් ද විශේෂයෙන් ම ඇමෙරිකන් එක්සත් ජනපද ආර්ථිකය අර්බුදයට ගොස් ඇත. බටහිර ක්‍රිස්තියානි නූතනත්වය මිනිසාට තමන් ගේ ආදායම් මට්ටමට වැඩියෙන් වියදම් කර ජිවත් වීමට උගන්වයි.

අවසානයේ විග්‍රහයේ දී පැහැදිලි වන්නේ අප ද බැංකු ද වෙනත් ආයතන ද ණය වී ඇත්තේ ස්වභාවධර්මයට බව ය. අප සම්පත් යොදා ගන්නේ ස්වභාවධර්මයට ණය වෙමිනි. උද්ධමනය හා ණය ගෙවාගැනීමට නොහැකි වීම අපේ පරිභෝජන ස්වභාවධර්මය සපයන සම්පත් ඉක්මවා යෑම සමඟ බැඳී පවතී. අද ලිබරල් ආර්ථිකය ක්‍රියාත්මක වන්නේ එකිනෙකා ගෙන් වෙන් ව ස්වාධීන ව ක්‍රියා කරන ආයතන තරගකාරීත්වය ඔස්සේ සමතුලිතතාවකට එළඹී ය යන උපකල්පනය යටතේ ය. එහෙත් සමස්තය සැලකිල්ලට ගන්නා රජය වැනි ආයතනයක් නොමැති ව එවැනි සමතුලිතතාවකට එළඹිය නොහැකි බව වත්මන් ආර්ථික අර්බුදයෙන් පෙන්නුම් කෙරෙයි. එසේ ම ස්වභාවධර්මය සමඟ ද සහජීවනයකින් තොරව මිනිසුන්ට පැවතිය නොහැකි බව ද පැහැදිලි ය.

බටහිර ගණිතයේ හා භෞතික විද්‍යාවේ කඩාවැටීම බොහෝ දෙනකුට නො පෙනුණ ද බටහිර ආර්ථිකයේ කඩා වැටීම විශාල ප්‍රමාණයකට ඇස් පනාපිට පෙනී යයි. එයට පිළියම ආර්ථිකයේ පමණක් සෙවිය නොහැකි ය. නිෂ්පාදනය තව තවත් වැඩි කිරීමට කැසකවන මාක්ස්වාදී ආර්ථිකයකට ද විසඳුම් නැත. මාක්ස්වාදය බටහිර ක්‍රිස්තියානි නූතනත්වයෙහි ම හිඳිමින් රජයේ මැදිහත්වීම වැඩි කරමින් ප්‍රශ්නවලට පිළිතුරු සෙවීමට උත්සාහ කරයි. ඒ අසාර්ථක බව සෝවියට් දේශයේ කඩා වැටීමෙන් පෙන්නුම් කෙරෙයි. ප්‍රශ්නය ඇත්තේ බටහිර ක්‍රිස්තියානි නූතනත්වයෙහි ය. බටහිර ක්‍රිස්තියානි නූතනත්වයෙහි හිඳිමින් ගණිතයෙහි, භෞතික විද්‍යාවෙහි හෝ ආර්ථිකයෙහි හෝ වෙනත් ක්ෂේත්‍රයක හෝ විසඳුම් සෙවිය නොහැකි ය.

අද බටහිර ක්‍රිස්තියානි නූතනත්ව ආධිපත්‍යය ඇත්තේ ඒ විසින් නිර්මාණය කර ඇති දැනුමෙහි ය. මේ දැනුම් ආධිපත්‍යය බටහිර යටත්විජිතවාදයෙහි එක් අංගයක් පමණකි. දැනුම් ආධිපත්‍යය බටහිර යටත්විජිතවාදයෙහි සංස්කෘතික යටත්විජිතවාදයට අයත් වෙයි. බටහිර දැනුම පමණක් වාස්තවික යැයි ද විද්‍යාත්මක යැයි ද සත්‍යයට ළඟා වන්නේ යැයි ද විශ්වීය යැයි ද අනෙක් දැනුම් ඒ ඒ දේශයට ඒ ඒ කාලයට පමණක් වලංගු වන්නේ යැයි ද අපට කියා දෙනු ලැබෙයි. එහෙත් බටහිර දැනුම ද සාපේක්ෂ ය. එය බටහිර ක්‍රිස්තියානි නූතනත්වයෙහි උපත ලබා ඇති අතර ග්‍රීක යුදෙව් ක්‍රිස්තියානි චින්තනය පදනම් කරගනිමින් බටහිර යුදෙව් ක්‍රිස්තියානි සංස්කෘතියෙහි නිර්මාණය වෙයි. එහි ඇති ඊනියා වාස්තවිකත්වයක් හෝ යථාර්ථයට කෙමෙන් ළඟා වීමෙක් හෝ නැත. මිනිසා ගේ මනසින් තොර ව පවතින යථාර්ථයක් පිළිබඳ දැනුම ද යුදෙව් ක්‍රිස්තියානි සංස්කෘතියෙහි නිර්මාණයක් පමණකි. මනසින් තොර යථාර්ථයක් වාස්තවිකත්වයක් ඇතැයි මනසින් තොර ව පෙන්විය හැකි අයකු නැත.

අද මිනිසාට නිවී සැනසිල්ලේ ජීවත් වීමට නොහැකි වී ඇත්තේ බටහිර ක්‍රිස්තියානි නූතනත්නවය හේතු කොටගෙන ය. වාසනාවකට එහි පදනම අද වන විට ඉරිතලා ගොස් ඇත. එහෙත් අවාසනාවකට තවමත් විකල්ප ජීවන ක්‍රමයක් තනා ගැනීමට මිනිසුන් අසමත් වී ඇත. බටහිර ගණිතයෝ හා භෞතික විද්‍යාවේ මෙන් ම ආර්ථික විද්‍යාවේ හා දේශපාලන විද්‍යාවේ ද සාහිත්‍යයේ ද දර්ශනයේ ද අනෙක් ක්ෂේත්‍රවල ද මේ විකල්ප ජිවන ක්‍රමය ගොඩනගාගත යුතු ය. අද පවත්නා තත්ත්වයට සාහිත්‍යය හා සාහිත්‍යය විචාරය ද වගකිව යුතු ය. මිනිසුන් ගේ ඉන්ද්‍රිය පිනවීම, එකිනෙකා පැරදවීමට කරන ජීවන අරගලය ආදිය ඊනියා යථාර්ථයක් ලෙස නිරූපණය කරන සාහිත්‍යයකට සමාජය

යහමග යැවිය හැකි නො වෙයි. එකිනෙකින් වෙන් කිරීමට තැත් කළ ද ගණිතය, භෞතික විද්‍යාව, ආර්ථිකය, දේශපාලනය, සාහිත්‍යය, ඉතිහාසය, දර්ශනය ආදී සෑම කෙෂත්‍රයක් ම බටහිර ක්‍රිස්තියානි නූතනත්වයෙහි එකිනෙකට බැඳී ඇත්තේ ග්‍රීක යුදෙව් ක්‍රිස්තියානි චින්තනය ඔස්සේ ය.

බටහිර ක්‍රිස්තියානි නූතනත්වයෙහි කඩා වැටීම යම් ප්‍රමාණයකට වසා ගැනීමට බටහිර තාක්ෂණය සමත් වී ඇත. මිනිසුන් අද තාක්ෂණයෙන් වශී වී ඇත. ලෝකය තාක්ෂණය නිසා කුඩා වී ඇතැයි කියැවෙයි. අනෙක් අතින් තාක්ෂණයෙන් සිදු වන හානි ගැන කියැවෙන විට බටහිර පඬියෝ හා මෙරට අනුකාරකයෝ තාක්ෂණය විද්‍යාවෙන් වෙන් වී ඇතැයි ද තාක්ෂණයේ වැරැදිවලට විද්‍යාව වගකිව යුතු නැතැයි ද කියති. එහෙත් මේ මුළාවකි. විද්‍යාව හා තාක්ෂණය එකිනෙක සමග බැඳී ඇත. එකක් වර්ධනය වන්නේ අනෙක සමඟ ය. විද්‍යාව හා තාක්ෂණය පමණක් නො ව විද්‍යාව හා සාහිත්‍යය ද තාක්ෂණය හා සාහිත්‍යය ද එකිනෙක සමග බැඳී ඇත.

මෙරට ජීවත් වන අපි අඩු ම තරමින් එක් අතකින් වාසනාවන්තයෝ වෙමු. අපේ මුතුන් මිත්තන් විසින් දිවි හිමියෙන් රැකගන්නා ලද සිංහල ථෙරවාද බෞද්ධ සංස්කෘතියට අප සියලු දෙනාට ම නිවී සැනසිල්ලේ ජිවත් විය හැකි සමාජයක් ගොඩනැගීමට හැකි විය. අප කළ යුත්තේ එවැනි සමාජයක් සඳහා අවශ්‍ය පදනම හා දැනුම සකස් කිරීම ය. අනෙක් පැත්තෙන් බටහිර ආධිපත්‍යයෙන් නිදහස් විය හැක්කේ ද බටහිර දැනුමට අභියෝග කරමින් අපේ ම දැනුමක් නිර්මාණය කිරීමෙන් ය. එහෙත් මෙයින් කියැවෙන්නේ මෙතෙක් බටහිර නිපදවා ඇති දැනුම මුළුමනින් ම බැහැර කිරීම නො වේ. බටහිරයන් පහළොස්වැනි සියවසේ කළ දේ ආපස්සට හරවමින් බටහිර දැනුම අපේ සංස්කෘතියට අවශෝෂණය කළ හැකි ය. ඒ අතර අපේ දැනුම ද නිර්මාණය කළ යුතු ය.

අපේ නව දැනුම යනු සිංහල බෞද්ධ චින්තනය මත පදනම් වී නිර්මාණය කරන දැනුමත් අනෙක් සංස්කෘතීන්හි දැනුම් අපේ සංස්කෘතියට අවශෝෂණය කිරීමෙන් නිර්මාණය කරන දැනුමත් ය.

**මහාචාර්ය නලින් ද සිල්වා**